සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

2024-02-12

Learning Resource Centre
De Mazenod College
Kandana
59582

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම - 2023 (2024)
ஆண்டிறுதி மதிப்பீடு - 2023 (2024)
Year End Evaluation - 2023 (2024)

| ශ්‍රේණිය / தரம் / Grade | 07 | විෂයය / பாடம் / Subject | සිංහල භාෂාව හා සාහිත්‍යය | පත්‍රය / வினாத்தாள் / Paper | I, II | කාලය / காலம் / Time | පැය 2 යි |
|---|---|---|---|---|---|---|---|

නම / பெயர் / Name ..............................   විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ..............................

- පළමු කොටසෙහි අංක 1 සිට 20 දක්වා ඇති ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

## I කොටස

01. පහත සඳහන් පාඨ අතර ඉඟි වැකියක් වන්නේ,
    1. කුකුළා අතින් අරන්.
    2. පතින්ට පෙර සිතා බලනු.
    3. ඉවසීමෙන් සැනසීම ලැබේ.
    4. උත්සාහවන්තයා ජයගනී.

02. පහත සඳහන් පාඨ අතර ප්‍රස්තාව පිරුළක් වන්නේ,
    1. බළලා මල්ලෙන් එළියට පැන්නා
    2. කරල පැහුණා
    3. කළුවා මාරපත් ගියා වගෙයි
    4. තරු පෙනුණා

03. පහත දැක්වෙන පිළිතුරු අතර මුලින් දී ඇති පදයට සමානාර්ථ පදයක් ඇතුළත් නොවන පිළිතුර තෝරන්න.
    1. දසන් (දත්, දළ, දන්ත)
    2. අහස (ගුවන, නුබ, ගගන)
    3. මුව (සිසි, මුහුණ, වත)
    4. මුහුද (සයුර, සමුදුර, සිඳු)

04. පහත සඳහන් පිළිතුරු අතර මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථ පදයක් සහිත පිළිතුර තෝරන්න.
    1. අභ්‍යන්තර (නිරන්තර, අන්තර, බාහිර)
    2. සම්මාන (අසමාන, විමාන, සමාන)
    3. යහගුණ (දෙගුණ, තෙගුණ, සුවගුණ)
    4. අනන්ත (අභ්‍යන්තර, අන්තර, සමාන්තර)

05. අප සතුව පවතින පැරණිම ව්‍යාකරණ ග්‍රන්ථය වන්නේ,
    1. සියබස්ලකර 2. සිදත් සඟරාව 3. ලෝකෝපකාරය 4. අමාවතුර

06. වර්තමාන සිංහල අක්ෂර මාලාවේ අල්පප්‍රාණ අක්ෂර සංඛ්‍යාව වන්නේ,
    1. 20 කි. 2. 15 කි. 3. 10 කි. 4. 30 කි.

07. පහත සඳහන් කියමන් අතර නිවැරදි කියමන වන්නේ,
    1. රකාරාංශය සහිත අක්ෂරයකට පසුව යෙදෙන්නේ දන්තජ "න" කාරයයි.
    2. හල් "ර" යන්නට පසුව යෙදෙන්නේ දන්තජ "න" කාරයයි.
    3. පද අවසානයෙහි හල් වී යෙදෙන්නේ මූර්ධජ "ළ" කාරයයි.
    4. "ණය" යන වචනය හැරුණ විට වෙනත් කිසිදු නූතන සිංහල වචනයක ආරම්භයෙහි "ණ" කාරය නොයෙදෙයි.

08. පහත සඳහන් පිළිතුරු හතර අතුරෙන් පද තුනේම නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත වරණය තෝරන්න.
    1. ශිෂ්ඨාචාරය, නිෂ්ඵල, විස්මය
    2. ශිෂ්ටාචාරය, විශ්මය, නිෂ්ඵල
    3. නිෂ්ඵල, ශිෂ්ටාචාරය, විස්මය
    4. නිස්ඵල, විශ්මය, ශිෂ්ඨාචාරය

09. අභිකුණ්ඨික ජනතාව භාවිතා කරන පහත දක්වා ඇති උපකරණ සාමාන්‍ය ව්‍යවහාරයේ දී හඳුන්වන නම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර වන්නේ,
(ඉරමන්, පි පෙට්ටි, මසකත්, තාලෙ)
1. හිරමනය, නයි පෙට්ටිය, පිහිය, බේසම
2. බේසම, පිහිය, නයි පෙට්ටිය, හිරමනය
3. හිරමනය, නයි පෙට්ටිය, බේසම, පිහිය
4. නයි පෙට්ටිය, හිරමනය, පිහිය, බේසම

10. වී ගොවිතැන හා බැඳුණු පහත සඳහන් පද වලට සාමාන්‍ය ව්‍යවහාරයේ දී භාවිත වන පද පිළිවෙලින් දැක්වෙන්නේ,
(තහංචි, හීල් අඩුත්තුව, කුඹල් ගෙඩිය)
1. උදේ ආහාරය, කළය, තහනම
2. තහනම, උදේ ආහාරය, කළය
3. කළය, තහනම, උදේ ආහාරය
4. තහනම, කළය, උදේ ආහාරය

11. උත්තම පුරුෂ, මධ්‍යම පුරුෂ හා ප්‍රථම පුරුෂ යනුවෙන් සිංහල භාෂාවේ පුරුෂ තුනකි. ඒ සඳහා පිළිවෙළට ගැළපෙන පිළිතුර තෝරන්න.
1. කොටියා, මම, තෝ
2. මා, කුරුල්ලා, තොපි
3. අපි, නුඹ, තාත්තා
4. ඇය, නුඹලා, අප

12. පහත සඳහන් වන ක්‍රියා පද වර්ග තුනට පිළිවෙලින් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
(අවසාන ක්‍රියා, පූර්ව ක්‍රියා, මිශ්‍ර ක්‍රියා)
1. කපමින්, කපති, කපා
2. කපති, කපමින්, කපා
3. කපා, කපති, කපමින්
4. කපති, කපා, කපමින්

13. නාම විශේෂණ පදයක් සඳහන් නොවන වාක්‍යය තෝරා යටින් ඉරක් අඳින්න.
1. නරක ළමයි පින් නොකරති.
2. මැටි භාණ්ඩ බිඳෙන සුලුය.
3. කාලය සෙමින් ගෙවී යයි.
4. කුරුලු නාදය කන් පිනවයි.

14. පහත සඳහන් වාක්‍ය අතර ක්‍රියා විශේෂණයක් සඳහන් නොවන වාක්‍යය තෝරන්න.
1. ළමයි සතුටින් කෑ ගසති.
2. උණු වතුර නිවා පානය කරන්න.
3. හාවෝ බියෙන් තැති ගනිති.
4. ගංගාව වේගයෙන් ගලා බසියි.

15. පහත දැක්වෙන වාක්‍යයේ හිස්තැන් වලට ගැළපෙන විරාම ලකුණු පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
ත්‍රිපිටක ධර්මය - සූත්‍ර - විනය - අභිධර්ම යනුවෙන් කොටස් තුනකි.
1. දෙතිත, කොමාව, කොමාව, තිත
2. කොමාව, කොමාව, දෙතිත, තිත
3. තිත, දෙතිත, කොමාව, කොමාව
4. දෙතිත, තිත, කොමාව, කොමාව

16. පහත සඳහන් පිළිතුරු වාක්‍යාංශයක් හා එයට අදාළ තනි පදයක් ලෙස දක්වා ඇත. වැරදි පිළිතුර තෝරන්න.
1. දෙවියන් වැඩ වසන ලෝකය - සුරලොව
2. පළමු වතාවට සිරිපා කරුණා කරන්නා - කෝඩුකාරයා
3. යමෙකු හෝ යමක් සිහිපත් කිරීම - අනුස්මරණය
4. දිය යට යන - පිහිනීම

17. කමත් භාෂාවේ යෙදෙන වචන කිහිපයක් පහත දැක්වේ. ඒවාට ව්‍යවහාර භාෂාවේ යෙදෙන වචන අනුපිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(ඇඹුල, කළු ගගුල, කිරි පබළු, රතු ගිඟුල)
1. කමත් බත, ආප්ප, තේ කහට, කෝපි
2. කෝපි, තේ කහට, කමත් බත, ආප්ප
3. කමත් බත, කෝපි, ආප්ප, තේ කහට
4. ආප්ප, තේ කහට, කෝපි, කමත් බත

18. ශ, ෂ, ස යන අකුරුවල නිවැරදිව පිළිවෙලින් අක්ෂර නාම යෙදෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.
1. තාලුජ, මූර්ධජ, දන්තජ
2. මූර්ධජ, දන්තජ, තාලුජ
3. දන්තජ, මූර්ධජ, තාලුජ
4. තාලුජ, දන්තජ, මූර්ධජ

19. සිංහල අක්ෂර මාලාවේ සඤ්ඤක අක්ෂර සම්බන්ධයෙන් වැරදි අදහස දෙන පිළිතුර තෝරන්න.
1. ව්‍යඤ්ජනාක්ෂර අතර සඤ්ඤක අක්ෂර යෙදේ.
2. සඤ්ඤක "ජ" වර්තමාන ලේඛන ව්‍යවහාරයේ නොයෙදේ.
3. සඤ්ඤක අක්ෂර ගණන හයකි.
4. සඤ්ඤක අක්ෂර පදයක මුලට නොයෙදේ.

20. සිංහල සාහිත්‍යයේ හමුවන උපදේශ කාව්‍ය තුනකි. ඒවා නම්,
1. ලෝකෝපකාරය, ගුත්තිලය, සුභාෂිතය
2. ගුත්තිලය, සුභාෂිතය, ලෝවැඩ සඟරාව
3. ලෝවැඩ සඟරාව, ගුත්තිලය, සුභාෂිතය
4. ලෝකෝපකාරය, ලෝවැඩ සඟරාව, සුභාෂිතය

(ලකුණු 2 × 20 = 40)

## II කොටස

- 1, 2 ප්‍රශ්න අනිවාර්යය වේ. 3, 4, 5, 6, 7 යන ප්‍රශ්නවලින් තවත් ප්‍රශ්න තුනක් තෝරාගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

01. පන්ති කාමර ඇගයීම් ප්‍රභේදයක් ලෙස ඔබ සකස් කළ බිත්ති පුවත්පත ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

   i. ඔබේ පන්තියේ බිත්ති පුවත්පතට යෙදූ නම කුමක්ද? (ලකුණු 02)

   ii. බිත්ති පුවත්පත නිර්මාණයේ දී ඔබට සහාය වූ දෙදෙනෙක් නම් කරන්න. (ලකුණු 02)

   iii. එම නිර්මාණය කිරීමේ දී ඔබ මුහුණදුන් ගැටලු දෙකක් ලියන්න. (ලකුණු 04)

   iv. බිත්ති පුවත්පත ඉහළින්ම සඳහන් කළ යුත්තේ කුමක්ද? (ලකුණු 02)

   v. මෙම බිත්ති පුවත්පත නිර්මාණයෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

   vi. පාසලක දක්නට ලැබෙන බිත්ති පුවත්පත් වර්ග කිහිපයකි. ඉන් දෙකක් සඳහන් කරන්න. (ලකුණු 04)

(මුළු ලකුණු 16)

02. පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරාගෙන වචන 150 කට නො අඩු වන සේ රචනයක් ලියන්න.

   i. යළි පිබිදෙමු ශ්‍රී ලංකා.

   ii. කොරෝනා වසංගතයේ යහපත් පැත්ත.

   iii. ඉන්ධන අර්බුදයේ අයහපත් පැතිකඩ.

   iv. අභිකුණ්ඨික රූගේ ගමට ඇවිත් (ලකුණු 14)

03. ඔබ පාසලේ පැවැත්වීමට නියමිත කලා උළෙල සඳහා ආරාධනා කිරීමට බලාපොරොත්තුවන අයට යැවීම සඳහා සුදුසු ආරාධනා පත්‍රයක් සකස් කරන්න. මනඃකල්පිත නම් ගම් භාවිත කරන්න. (ලකුණු 10)

- පහත දැක්වෙන 4, 5 ප්‍රශ්නවලට පෙළපොත ඇසුරෙන් පිළිතුරු සපයන්න.

04. "ඒ බව ඇසීම මට මහත් ප්‍රීතියක්, දෙවියන්ගේ අණ පරිදි මම ඔබගේ හරක් බාන බිලි ගැනීමට ආමි"

   i. මෙසේ පැවසුවේ කවුද?

   ii. මෙසේ පැවසුවේ කාටද?

   iii. ඉහත කොටස උපුටාගත් පාඩමේ නම ලියන්න.

   iv. එම පාඩම උපුටාගත් මුල් පොතේ නම ලියන්න.

   v. මෙම ජන කතාව කිනම් රටක ජන කතාවක්ද? (ලකුණු 2 ×5 = 10)

05. "ඊට තොප වික්ෂේප නොවැ: තොපගෙන් කෑ තලවලට මම මිල දෙමි"

   i. මෙම ප්‍රකාශය කළේ කවුද?

   ii. මෙසේ කීවේ කාටද?

   iii. මෙම කොටස උපුටාගත් පාඩමේ නම ලියන්න.

   iv. මෙම කොටසේ තල කෑ පුද්ගලයා කවුද?

   v. මෙම පාඩම උපුටාගත් පොතේ නම කුමක්ද? (ලකුණු 2 × 5 = 10)

06. පහත සඳහන් පද්‍ය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"මේග ගං පල තුරු
    පරහට ම වැඩ පමුණුවන මෙන්
සුදනන් ලත් ඉසුරු
    සව් සතට වැඩ වේ ය නිතියෙන්"
"තම හට නො සරි වන
    සබා මැද ඉදිනුව කර බා
සඳ දැක කොඳු පුබුදු
    වනු දැක පියුම් හැකිළෙන මෙන්"

i. මෙම කවි ඇතුළත් පාඩමේ නම කුමක්ද?
ii. මෙම පාඩම උපුටාගත් කෘතිය නම් කරන්න.
iii. එම කෘතියේ රචකයාගේ නම ලියන්න.
iv. ඉරි ඇඳි පදවල අර්ථය ලියා දක්වන්න.

(ලකුණු 2 × 5 = 10)

07. පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

ශ්‍රී ලාංකිකයන් වූ කලී ආරම්භයේ සිට ම ගොවිතැන තම ජීවනෝපාය වශයෙන් සලකා කටයුතු කළ පිරිසකි. මුල් යුගයේ ආර්යයන්ගෙන් ලද ආභාෂයත්, ඊට සරිලන ආකාරයෙන් මෙරට තුළ පවත්නා තැනිතලා, පහත් බිම්, ගංගා ආශ්‍රිතව මෙන් ම වර්ෂාව තුළින් ලැබෙන ජලය, ගංගා නිම්නයන් හී ඇති සරු පස හා ගංවතුර, නියඟ වැනි ස්වාභාවික විපත් අවම වීම ආදී කරුණු නිසාත් නිරායාසයෙන් මෙරට ජනතාව ගොවිතැන සඳහා යොමු වූයේ යැයි කිව හැකිය. පසු කාලීන ව හුදු ජීවන වෘත්තිය වූවා පමණක් නොව, ඒ මත ගොඩ නැගුණු පුළුල් සංස්කෘතිකාංගයන් නිර්මාණය වූ අතර ඒ සියලු කාරණයන් කෙරෙහි බලපෑ තීරණාත්මක සාධකය වූයේ භූගෝලීය වශයෙන් පිහිටීම බව අවධාරණය කළ යුතුය. ඒ අතර ගොවිතැන ආශ්‍රය කොටගත් ජන සම්ප්‍රදායන් ජන කවි (ගොයම් කවි, පැල් කවි, ජන නැටුම්, භාරහාර, දේවපූජා උත්සව) ආදියත් ඇගයුම් හා විශ්වාස ආදියත් ජන සමාජයට නිරායාසයෙන් එකතු විය.

i. මෙහි සඳහන් ආකාරයට ශ්‍රී ලාංකිකයන් ආරම්භයේ සිට තම ජීවනෝපාය කර ගත්තේ කුමක්ද?
ii. ශ්‍රී ලාංකික ජනතාව නිරායාසයෙන් එම වෘත්තිය තෝරා ගැනීමට හේතු වූ කරුණු දෙකක් සඳහන් කරන්න.
iii. ගොවිතැන හුදු ජීවන වෘත්තිය වූවා පමණක් නොව ඒ මත විවිධ සංස්කෘතිකාංගයන් ද බිහි විය. ඒ සඳහා බලපෑ තීරණාත්මක සාධකය කුමක්ද?
iv. ගොවිතැන ආශ්‍රයෙන් ගොඩ නැගුණු ජන කවි වර්ග දෙකක් නම් කරන්න.
v. මෙහි සඳහන් වන ස්වාභාවික විපත් දෙකක් නම් කරන්න.

(ලකුණු 2 ×5 = 10)
(මුළු ලකුණු 60)